# කහදව ගල්ලෙන් විහාරය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක සාධක

මන්දාරම් නුවර සුමංගල හිමි

සමාජීයවිද්‍යා පීඨය, කැලණිය විශ්වවිද්‍යාලය

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම අංක 4 කහදව ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ පිහිටා ඇති කහදව ගල්ලෙන් විහාරය වළගම්බා රාජ්‍ය සමය දක්වා දිවයන්නක් බව කියැවේ. මෙම පර්යේෂණයේ අරමුණ වන්නේ ඉතා දුර්ලභ බිතුසිතුවම් හා පුරාකෘති සහිත මෙම ලෙන් විහාරය ජනයාගේ අවධානයට යොමු කිරීමත් ගල්ලෙන් විහාරය ආශ්‍රිත පුරාවිද්‍යාත්මක උරුමයන් හඳුනාගැනීම ය. එසේ ම මහනුවර යුගයට අයත් යැයි සැලකෙන මෙම විහාරයෙහි බිතුසිතුවම් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව මගින් සංරක්ෂණය කිරීමට කටයුතු කළ නමුත් මේ වන විට හායනයට ලක්වෙමින් පවතියි. මෙම විහාරය තුළ පුරාවිද්‍යාත්මක වශයෙන් වැදගත් කෘති රාශියක් දක්නට ලැබෙන අතර එහි නිශ්චිත කාලයක් කිව නොහැකි විශාල ජල බඳුනක් ද එසේ ම කැටයම් කෙටූ දූව කිහිපයක් ද මහනුවර යුගයට අයත් බුද්ධ ප්‍රතිමාවක් ද බුද්ධරූපයක් සිතුවම් කළ දූව කැබැල්ලක් ද හඳුනාගනු ලැබිණි. මෙම විහාරයෙහි රහතන්වහන්සේ නමක් වැඩ සිටි බවට සාහිත්‍යයමය හා ජනප්‍රවාද සාධක වේ. පර්වතය පාමුල ස්ථාන කිහිපයකම කටාරම් කොටා ඇති අතර එම ස්ථානයන් වාසස්ථාන ලෙස භික්ෂූන් භාවිත කරන්නට ඇති බව සිතිය හැකිය. දඹුලු විහාරයට සමාන ආකෘතියකින් යුත් මෙම ලෙන් විහාරයට මඳක් ආසන්න ව පැරණි සොහොනක් ද දැකිය හැකි ය. සිතුවම්වල චීවරය යොදා තිබෙන ආකාරයෙන් ද ලෙන් බිත්තිය ආවරනය වන පරිදි සිතුවම් ඇඳ තිබීමෙන් ද මහනුවර යුගයට අයත් නරපතියෙකුගේ රූපයක් සිතුවම් කිරීමෙන් ද සිතුවම්ගත ලියවැල් ආදියෙන් ද මිනිස් රූප දේවතා රූප සිතුවම් කර තිබෙන අයුරින් ද සිවිලිම හංසපූට්ටු හා මල් මෝස්තරවලින් අලංකරණය කර තිබීමෙන් ද මහනුවර යුගයට අයත් සිතුවම් සහිත ලෙන්විහාරයක් ලෙස මෙම ලෙන් විහාරය වැදගත් වන බව පෙනේ. පුරාකෘති රාශියක් පවත්නා මෙම ලෙන් විහාරය පිළිබඳව තවදුරටත් පර්යේෂණ සිදුකෙරෙමින් පවතියි.

ප්‍රමුඛ පද : කහදව ගල්ලෙන් විහාරය, සිතුවම්